## ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය - 2018

-----------------------------------------------------------

### 1.1 මතය ව්‍යාවනය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡාකර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණයක් පහතින් දක්වා ඇත.

| විෂයය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෘත්තීය ගාස්තු අයකිරීම් රු.299,793,009 ක්, වෘත්තීය ගාස්තු ගෙවීම් රු.386,839,872 ක් හා වෘත්තීය ගාස්තු මත අයකළ රඳවා ගැනීම් බදු රු.12,047,910 ක් ගිණුම්ගත කිරීම සඳහා ලෙජර් ගිණුම් පවත්වා නොතිබුණි. ඒ වෙනුවට වෘත්තීය ගාස්තු අයකිරීම්, ගෙවීම් හා වෘත්තීය ගාස්තු මත අයකළ රැඳවුම් බදු වෘත්තීය ගාස්තු නමින් වූ ගිණුමකට මාරුකර තිබුණු අතර එම ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට පැවති හඳුනානොගත් රු.112,663,449 ක හර ශේෂය රෝහල් ගාස්තු පාලන ගිණුමට මාරු කර තිබුණි. | 2019 වර්ෂයේ සිට වෘත්තීය ගාස්තු ක්‍රමානුකූලව ගිණුම්ගත කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් හඳුන්වාදීමට කටයුතු කර ඇති බව හා ගිණුම්කරණ පද්ධතිය තුළ සහ Systolic තොරතුරු පද්ධතිය තුළ අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අයවිය යුතු වෘත්තීය ගාස්තු, අයකළ වෘත්තීය ගාස්තු, ගෙවිය යුතු වෘත්තීය ගාස්තු, ගෙවූ වෘත්තීය ගාස්තු හා වෘත්තීය ගාස්තු මත අයකළ රැඳවුම් බදු වෙනුවෙන් ලෙජර් ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 | | |
| (i) ප්‍රමිතයේ 95 (ඇ) ඡේදය ප්‍රකාරව, 2018 දෙසැම්බර් 31 දිනට ස්කන්ධ ප්‍රාග්ධනය තුළ පැවති රු.2,280,000 ක් වූ ප්‍රාග්ධන සංචිතයේ ස්වභාවය හා අරමුණු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2002 වර්ෂය තුළ දී මෝටර් රථයක් ප්‍රත්‍යාගණනය කිරීම මගින් ඇතිවූ සංචිතයක් මෙමගින් පෙන්නුම් කරන බව හා 2019 වර්ෂය තුළදී ගිණුම් තුළ නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව. | 2019 වර්ෂයේ ගිණුම්වල නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |
| (ii) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව, 2018 දෙසැම්බර් 31 දිනට රු.689,609,072 ක් වූ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල මිනුම්කරණ පදනම හෙළිදරව්කර නොතිබුණි. | සාමාන්‍යයෙන් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනුයේ අදාළ දිනය දක්වා ඒ වෙනුවෙන් දරන ලද සමුච්චිත පිරිවැය වන බව, මේ සඳහා මිණුම්කරණ පදනමක් විශේෂයෙන් හෙළිදරව් කිරීම අවශ්‍ය නොවන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 ප්‍රකාරව, කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල මිනුම්කරණ පදනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත්කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.50,109,965 ක් 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සමුච්චිත ඌනතාවයට හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමවලට ගැලපීම්කර තිබුණි. | 2019 වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,225,037,613 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව, මෙම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බව, එය ආයතනයට අමතර පිරිවැයක් වන බව හා එමගින් මූල්‍යමය වශයෙන් එකතුකළ | සම්පූර්ණයෙන්ම ක්ෂයකර අවසන්ව ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින ජංගම නොවන වත්කම් නැවත අගය |

| | | |
|---|---|---|
| පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. | අගයක් නොමැති හෙයින් ඒ සඳහා විශේෂ පියවරක් ගෙන නොමැති බව. | කිරීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.5,412,150 ක් ගිණුම්ගතකර නොතිබුණි. | 2019 වර්ෂයේදී මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂයට අදාළව ගෙවිය යුතු සියලුම වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවස්ථා 10 කදී හා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 14 කදී සැපයුම්කරුවන්ගෙන් අඩුකර තිබුණු පිළිවෙලින් රු.2,875,084 ක් හා රු.4,645,974 ක් වූ දඩ මුදල් ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේදී මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉදිකිරීම් කොන්ත්‍රාත් 16 ක් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී අඩුකර ගෙන තිබුණු රු.31,832,324 ක් වූ රඳවා ගැනීම් ගිණුම්ගතකර නොතිබුණි. | 2019 වර්ෂයේදී මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශන මගින් ගනුදෙනුවේ නිවැරදි ස්වරූපය හෙළිදරව් කළ යුතුය. ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 දෙසැම්බර් මාසයේදී වෘත්තීය ගාස්තුවලින් අඩුකර ගෙන තිබුණු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු රඳවා ගැනීමේ බදු රු.1,943,110 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙවැනි අතපසුවීම් ඉදිරියේදී ඇති නොවීම සඳහා කටයුතු කරන බව. | උපචිත පදනම මත වර්ෂයට අදාළ ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල නේවාසික ගාස්තු මත වූ එකතු කළ අගය මත බදු වටිනාකම රු.7,787,448 කින් වැඩියෙන් ගණනය කර ගිණුම්ගතකර තිබුණි. | 2019 වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී පෙර වර්ෂයට අදාළ ගනුදෙනුවක් ලෙස සලකා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු පාලන ගිණුමේ පැවති පිළිවෙලින් රු.16,271,838 ක හා රු.18,013,133 ක හර ශේෂවලට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුනොකර එම ශේෂ නේවාසික ගාස්තු ආදායම් ගිණුමට මාරුකර තිබුණි. | රෝහල් ගාස්තු පාලන ගිණුමට සටහන් කරන අයිතම කාලීනව සැසඳීමක් සිදුනොවන බව, මෙවැනි දෝෂ ඇතිවීම වළක්වා ගැනීම සඳහා 2019 වර්ෂයේ සිට රෝහල් ගාස්තු පාලන ගිණුම මාසිකව සැසඳීමට කටයුතු යොදා ඇති බව. | පරිගණක ගිණුම්කරණ පද්ධතියේ පවත්නා අඩුපාඩු නිවැරදි කර ගත යුතුය. පද්ධතිය තුළට දත්ත ඇතුළත් කිරීමේදී, මාරු කිරීමේදී හා මකා දැමීමේදී සිදුකළ යුතු විධිමත් ක්‍රමවේද හා පාලන පද්ධති හඳුන්වා දිය යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | රෝහල් ගාස්තු ආදායම් රැස්කරන මුදල් ගිණුමට හර වී තිබුණු රු.4,202,876 ක් නිවැරදිව හඳුනානොගෙන නේවාසික ගාස්තු ආදායම් ගිණුමට මාරුකර තිබුණි. | මෙවැනි දෝෂ ඇති නොවීම තහවුරු කිරීම සඳහා අතැති මුදල් ගිණුමට දෛනිකව මාරුවන දත්තවල නිවැරදිතාවය එදිනෙදා තහවුරු කිරීමට කටයුතු කරන බව. | අතැති මුදල් ගිණුමට දෛනිකව මාරු කරනු ලබන ශේෂයන් හා පරිගණක පද්ධතිය වෙතින් ආනයනය කරනු ලබන දත්තයන් එකිනෙක සැසඳීම් සිදුකර නිරවද්‍යතාවය පිළිබඳව තහවුරුවක් ලබාගත යුතුය. |
| (ඌ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.334,611,222 ක් වූ ඉන්වෙන්ට්‍රි තොගය තුළ පැවති කල් ඉකුත් වූ තොගයේ පිරිවැය රු.2,948,800 ක් ලාභයට එරෙහිව කපාහළ යුතු වුවද, ඒ වෙනුවට කල් ඉකුත් වූ තොග වෙනුවෙන් රු.6,692,224 ක වෙන්කිරීමක් සිදුකර තිබුණි. මෙම වෙන්කිරීමේ ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. “පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට” තොගය අගය කර ගිණුම්ගත කළ යුතු වුවද තොගවල ශුද්ධ උපලබ්ධි අගය නොසලකා පිරිවැය ගිණුම්ගත කර තිබුණි. | කල් ඉකුත් වූ හා අනෙකුත් තොග හානි සඳහා සිදුකර ඇති වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෙළිදරව් කිරීම අතපසුවී ඇති බව, රෝහල සතුව පවතින තොග අයිතමවල ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් සියළුම තොග අගය කොට ඇත්තේ ඒවායේ ඓතිහාසික පිරිවැයට වන බව හා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ හෙළිදරව් කිරීම් තුළ පිරිවැය හෝ “ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට” තොගය අගය කොට ඇති බව සඳහන් වීම නිවැරදි නොවන බව පිළිගන්නා බව. | කල් ඉකුත් වූ තොගවලට අදාළ පිරිවැය නිවැරදිව හඳුනාගෙන විධිමත් අනුමැතියකින් ගිණුම්වලින් කපාහැරීමට කටයුතු කළ යුතුය. “පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට” තොගය අගය කර ගිණුම්ගත කළ යුතුය. කල් ඉකුත් වූ තොග සඳහා වෙන් කිරීම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වැරදි නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | කොළඹ ජාතික රෝහල හා ළමා රෝහලේ රෝගීන්ගේ ශල්‍යකර්ම සිදුකිරීම වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට එම රෝහල්වලින් ලැබිය යුතු රෝහල් ගාස්තු රු.1,220,216 ක් ගිණුම්ගත නොකර ඒ වෙනුවට වෛද්‍ය සැපයුම් අංශයට ගෙවිය යුතු වටිනාකමට හිලව්කර තිබුණි. | මෙම දෝෂය 2019 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | රසායනාගාර සංකීර්ණයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් ආපසු ගෙවන ලද රැඳවුම් මුදල් රු.1,351,526 ක් ප්‍රාග්ධන ගතනොකර ගොඩනැගිලි අළුත්වැඩියා ගිණුමට හරකර තිබුණි. | මෙම දෝෂය 2019 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2016 වර්ෂයේදී අපහරණය කර තිබුණු උපකරණ ඒකක 3,892 කද, ඉකුත් වර්ෂයේදී රු.4,391,608 කට විකුණා තිබුණු වෛද්‍ය උපකරණ, විදුලි සෝපාන, විදුලි උත්පාදක යන්ත්‍ර, ගොඩනැගිලි ද්‍රව්‍ය, ලී බඩු උපකරණ, රෝද පුටු හා වෙනත් උපකරණවලද, සමාලෝචිත වර්ෂයේදී රු.638,100 කට විකුණා තිබුණු වෛද්‍ය හා ශල්‍ය උපකරණ, ගොඩනැගිලි හා කාර්යාල උපකරණ, විදුලි උපකරණ හා රසායනාගාර උපකරණවලද පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව, නමුත් එම ඉවත්කළ අයිතමවල පිරිවැය සහ සමුච්චිත ක්ෂය අගයන් වෙන වෙනම හඳුනාගැනීමේ අපහසුතාවය නිසා විකිණීමෙන් ලද මුදල ගිණුම්කරණ ලාභයක් ලෙස හඳුනාගෙන ඇති බව. | ඉවත් කරන ලද ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | 2016 හා 2017 වර්ෂයන්හිදී කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි 03 ක පිරිවැය රු.5,608,800 ක් හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත්කර නොතිබුණු අතර එම ගොඩනැගිලි 03 වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.112,175 ක් ක්ෂයකර තිබුණි. | මෙම දෝෂය 2019 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉවත් කරන ලද ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ලෙජර් ගිණුම අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) සමුච්චිත ඌනතාවය | | | | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා Accpac පද්ධතිය තුළද නිවැරදි සමුච්චිත ඌනතාවය ගැලපීමට අදාළ කටයුතු සිදු කරන බව. | Accpac ගිණුම්කරණ පද්ධතියේ පවතින දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. පද්ධතිය තුළ දැක්වෙන ශේෂය හා මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන ශේෂයන් සැසඳෙන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| 2018 ජනවාරි 01 දිනට | 774 | 878 | 104 | | |
| 2018 දෙසැම්බර් 31 දිනට | 707 | 824 | 117 | | |
| (ආ) සමුච්චිත අරමුදල් ගිණුමට පෙර වර්ෂ ගැලපීම් | 50 | 54 | 4 | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | සෑම විටම ලෙජර් ගිණුම් හා මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ශේෂයන් සැසඳෙන බවට වගබලා ගත යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| විවිධ තැන්පතු | 4,339,582 | වර්ෂ 21 කට වඩා පැරණි විවිධ තැන්පතුවලට අදාළ ලේඛන | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව, 1984 සිට 2007 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ කළ තැන්පතු වන නමුත් තැන්පතුව කළ පුද්ගලයන් | මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය. එසේ කළ නොහැකි ශේෂ |

| | | |
|---|---|---|
| | හා රිසිට්පත්වල මුල් පිටපත් සොයාගත නොහැකි බව හා අදාළ ආයතන මඟින් තහවුරුකර ගැනීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතුව ඒවා වියදම් ලෙස කපා හැරීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතිය ලබාගෙන ගිණුම්වලින් කපාහැරීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

--------------------------------------

**1.6.1 ලැබිය යුතු මුදල්**

-------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා යුධ හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතින් 2009 වර්ෂයට පෙර සිට අයවිය යුතු රෝහල් ගාස්තු පිළිවෙලින් රු.2,438,514 ක් හා රු.1,698,819 ක් අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතිය ලබාගෙන ගිණුම්වලින් කපාහැරීමට කටයුතුකර නොතිබුණි. | ලැබිය යුතු ශේෂය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව කපා හැරීමට කටයුතු කරන බව. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා මුදල් රෙගුලාසි 113 (3) ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අධිකාරී බලය ලබා ගෙන පොත්වලින් කපාහළ යුතුය. 2016 පෙබරවාරි 12 දිනැති අංක 2/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතුය. |
| (ආ) සීමාවාසික වෛද්‍යවරුන් වෙත 2013 වර්ෂයේදී ගෙවා තිබුණු වැටුප් රු.1,112,280 ක් හා සෞඛ්‍ය අධ්‍යාපන විශ්ව විද්‍යාල විද්‍යායතනය පවත්වාගෙන යාම වෙනුවෙන් ලැබිය යුතු රු.4,364,660 ක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතුකර නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව, සීමාවාසික වෛද්‍යවරුන් වෙත ගෙවා ඇති වැටුප් ප්‍රතිපූරණය සඳහා සිහිකැඳවීම් ලිපියක් අමාත්‍යාංශයට යනව බව, සෞඛ්‍ය අධ්‍යාපන විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන වියදම් එහි වත්කම් රෝහලට පවරා ගැනීම මඟින් අයකර ගැනීමටත් කටයුතු කරන බව. | සීමාවාසික වෛද්‍යවරුන් වෙනුවෙන් ගෙවන ලද වැටුප් හා සෞඛ්‍ය අධ්‍යාපන විශ්ව විද්‍යාලය පවත්වාගෙන යෑම වෙනුවෙන් දරන ලද වියදම් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූරණය කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ආයතන 4 කින් 1997, 1998, 2008, 2009, 2010 හා 2017 වර්ෂවලට අදාළව අයකරගත යුතු විදුලි ගාස්තු රු.78,876 ක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අයකර ගෙන නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව, අයවිය යුතු ශේෂය තුළ පැරණි වර්ෂවලට අදාළව රෝහල් පරිශ්‍රය තුළ වූ කඩසාප්පු වලින් අයවිය යුතු විදුලි බිල්පත් වන අතර මේවා තවදුරටත් අයවිය යුතු ශේෂයන්ද යන්න සොයා බැලීම සඳහා ලිඛිත සාක්ෂි නොමැති හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව පොත් වලින් කපාහැරීමට කටයුතු කරන බව. | මේ සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි සොයා ගැනීමට සෑම උත්සහයක්ම දැරිය යුතුය. එය ප්‍රතිඵලදායී නොවේ නම් විධිමත් අනුමැතියක් සහිතව ගිණුම්වලින් කපාහැරීමට කටයුතු කළ යුතුය. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අදාළ නිලධාරීන් වෙත නිශ්චිත වගකීම් පැවරිය යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 6 කට වඩා පැරණි රු.4,530,134 ක් වූ විවිධ ණයහිමි ශේෂ 11 ක්, රු.800,907ක් වූ කාර්යසාධන ඇප බැඳුම්කර තැන්පතු ශේෂ 7 ක් හා රු.3,616,142 ක් වූ ගෙවිය යුතු වෘත්තීය ගාස්තු, නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හෝ කටයුතුකර නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමග එකඟ වන බව, නැවත නොගෙවිය යුතු යැයි හඳුනාගන්නා ශේෂයන් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | මෙම ආදායම් හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට පෙර ණයහිමියන් හා ආයතන වෙතින් විමසීමට හා තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය. විමසීම සඳහා ලැබෙන ප්‍රතිචාර අනුව නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හෝ කටයුතු කළ යුතුය. |

## 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය සඳහා විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් (Electronic Document Management System) සැපයීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව, මණ්ඩලයේ අධ්‍යක්ෂවරයාගේ භාර්යාව අධ්‍යක්ෂවරියකව සිටි සමාගමක් වෙත 2015 නොවැම්බර් 26 දින ප්‍රදානය කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට එම සමාගම වෙත රු.17,675,727 ක් ගෙවා තිබුණි. නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය ආරක්ෂා නොවන ලෙස කටයුතු කරමින් සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. මණ්ඩලයේ සභාපති විසින් පත්කළ යුතු තාක්ෂණික ඇගයීම් කමිටුව මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා විසින් පත්කර තිබුණු අතර ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය ආකාරයට පිරිවිතර පිළියෙලකර නොතිබුණි. සැපයුම්කරු සතු විය යුතු සුදුසුකම් හා යෝග්‍යතා පිළිබඳ ඇගයීම සහ තාක්ෂණික ඇගයීම නිසි ලෙස සිදුකර නොතිබුණු අතර ව්‍යාජ ලිපිනයන් හා දුරකථන අංකයන් සහිත ලංසුවක් බව හඳුනාගැනීමටවත් තාක්ෂණික ඇගයීම් කමිටුව අපොහොසත් වී තිබුණි. | මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විමර්ශනයක් පවත්වන බව, එහි වාර්තාව ලද පසු ගනු ලබන ක්‍රියාමාර්ග පසුව ඉදිරිපත් කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය ආරක්ෂා නොවන ලෙස කටයුතු කරමින් සැපයුම්කරු තෝරා ගැනීම සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් සිදුකළ යුතුය. සම්බන්ධිත පාර්ශවයන් සමඟ පවතින ගනුදෙනු පිළිබඳව ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

**1.8 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2004 දෙසැම්බර් 15 දිනැති අංක 06/2004 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 22.1 උප වගන්තිය. | 2017 ජනවාරි 09 දින වැඩ තහනම්කර තිබුණු භෞත චිකිත්සක නිලධාරියෙකු සේවයෙන් පහකිරීම සඳහා මාස 18 කට ආසන්න කාලයක් ගතකර තිබුණු නමුත් එම කාලය තුළ නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණ කිසිවක් පවත්වා නොතිබුණි.<br>නිලධාරියාගෙන් කිසිදු සේවයක් ලබානොගෙන එම කාලය තුළදී අඩ වැටුප් ලෙස රු.593,435 ක් ගෙවා තිබුණි. | මෙම නිලධාරියාව 2017 ජනවාරි 09 දින වැඩ තහනමකට ලක්කර මූලික විමර්ශනයකින් පසුව චෝදනා පත්‍රයක් නිකුත් කරන ලද බව, අදාළ චෝදනා පත්‍රයේ සියළු චෝදනාවන් සඳහා ඔහු වරද පිළිගත් බව, අංශ ප්‍රධානීගේ මතයද ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර සේවයෙන් පහකළ බව, අවස්ථා කිහිපයකිදි විවිධ මත හා ගැටළු පැන නැගුණු බැවින් අවසන් තීරණයක් ගැනීම ප්‍රමාද වූ බව. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ විධි විධානයන්ට අනුව කටයුතු නොකල, අදාළ තීරණ ගැනීම සඳහා නියමිත කාලය තුළ විනය පරීක්ෂණ නොපැවැත්වූ හා තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග විගණනයට වාර්තා කළ යුතුය. |
| (ආ | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 139 | සහතික කිරීමේ නිලධාරී විසින් සහතිකකර නොතිබුණු එකතු අගය රු.16,242,266 ක් වූ වවුචර් 12 ක් සඳහා ගෙවීම් කර තිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා මෙවැනි දෝෂ ඉදිරියේ ඇති නොවීමට කටයුතු කරන බව. | ගෙවීම් කිරීම සඳහා චෙක්පත් ලිවීමට පෙර මුදල් රෙගුලාසි ප්‍රකාරව, සහතික කිරීමේ නිලධාරී විසින් අදාළ වවුචර් සහතිකකර ඇති බව තහවුරු කරගත යුතුය. සහතික කරන ලද වවුචර් සඳහා පමණක් ගෙවීම් කරන බවට වගබලා ගත යුතුය. |
| (ඇ | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම්වල බොහෝ තොරතුරු ඇතුළත් ලේඛනයක් පිළියෙලකර තිබෙන බව, එය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පරිගණක ගත ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සම්පාදනය කරනු ලබන බව. | ස්ථාවර වත්කම්වල සියලුම තොරතුරු නිරීක්ෂණය සඳහා ගැටළුවකින් තොරව ප්‍රවේශ විය හැකි ආකාරයට පරිගණක ගත ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ | 2001 ජූලි 02 දිනැති අංක 02 - 72/2001 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු චක්‍රලේඛ ලිපිය. | රසායනාගාර ඕඩර්ලි (Orderly) සේවකයින් විසින් සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව සුදානම් කරන නිදර්ශක පදනම් කරගෙන දීමනා ගෙවිය හැකි වුවද, Haematology අංශයේ සේවකයින් 16 දෙනෙකු වෙත නිදර්ශක භාවිතයෙන් සිදුකරනු ලබන පරීක්ෂණ සංඛ්‍යාව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව තුළදී පමණක් රු.179,315 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර වහාම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ චක්‍රලේඛනය මගින් ඉඩ දී ඇති නිදර්ශක සඳහා පමණක් ගෙවීම් සිදුකරන බවට තහවුරුවක් ලබාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. රාත්‍රි කාලයේ සිදුකරනු ලබන නිදර්ශක සම්බන්ධයෙන් මාසික වාර්තාවක් පිළියෙලකර දීමනා ලබාගැනීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2006 මැයි 10 දිනැති අංක Q 2 - 84/2006 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු චක්‍රලේඛ ලිපිය. | 2018 පළමු කාර්තුව තුළදී පමණක්, සිදුකර නොතිබුණු Heamatalogy අංශයේ පරීක්ෂණ 11,970 ක් වෙනුවෙන් රු.269,325 ක් හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දීමනා ගෙවිය නොහැකි Heamatalogy හා Biochemistry පරීක්ෂණ 35,203 ක් වෙනුවෙන් රු.792,067 ක් එම අංශවල නිලධාරීන් 27 දෙනෙකු වෙත ගෙවා තිබුණි. | මෙහි සඳහන් සියලු කරුණු සම්බන්ධව නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන ආකාරයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2018 පෙබරවාරි 15 දිනැති අංක Health Ministry/CA/17/2018 දරන මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමේ ලිපිය. | මණ්ඩලයේ සභාපතිගේ හෝ අධ්‍යක්ෂගේ පෞද්ගලික අනුමැතිය නොමැතිව, නිලධාරීන් 36 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළදී පමණක් මූලික වැටුප ඉක්මවා රු.4,278,343 ක් කැලි පදනම මත දීමනා හා නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණි. | මෙහි සඳහන් සියලු කරුණු සම්බන්ධව නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් ප්‍රකාරව මාසික මූලික වැටුප ඉක්මවා අතිකාල, නිවාඩු දින වැටුප් හා අමතර රාජකාරි දීමනා නොගෙවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.117,086,848 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පාඩුව රු.149,619,386 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.266,706,234 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, සමාලෝචිත වර්ෂයේ වියදම රු.620,955,656 කින් වැඩිවුවද, ආදායම රු.887,661,889 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාමාන්‍ය වාර්ෂික රෝහල් ගාස්තු ආදායම රු.මිලියන 2,000 කට අධික වුවද, අයකරන රෝහල් ගාස්තු නිශ්චය කිරීම සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුනාගෙන ක්‍රියාත්මකකර නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව, ඒ ඒ කාලවලදී අදාළ විශේෂඥ වෛද්‍යවරු හා කලින් කලට ක්‍රියාත්මක වූ මිල කමිටු විසින් නිර්දේශ කරන ලද ගාස්තු අයකරන නමුත් නිවැරදි හා ස්ථිර මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන බව, මුළු පිරිවැය පදනම් කොට ගෙන වඩාත් නිවැරදි වූ මිල ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දී ඇති බව, පොදුකාර්ය වැනි වක්‍ර වියදම් හඳුනාගැනීමට ඇති ප්‍රායෝගික දුෂ්කරතා නිසා මෙම මිල ප්‍රතිපත්තිය හඳුන්වාදීම ප්‍රමාද වී ඇති බව, රෝහල පිහිටුවීමේ අරමුණ ලාභ ලැබීම නොවන හෙයින් පිරිවැය ආවරණය වන මිල ක්‍රමයක් හඳුන්වාදීමට ඉදිරියේදී කටයුතු කරන බව. | විවිධ පරීක්ෂණ, ශල්‍යකර්ම හා රෝගීන් සඳහා රෝහල විසින් සපයනු ලබන වෙනත් සේවාවන් සඳහා වූ ගාස්තු තීරණය කිරීමට හා ඒවා වරින්වර සංශෝධනය කිරීම සඳහා මිල කමිටුවක් පත්කළ යුතුය. මිල කමිටු තීරණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. මුළු පිරිවැය ආවරණය වන පරිදි මිල තීරණය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. මිල සැකසෙන පදනම පරිගණක මෘදුකාංග පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේදී යොමුකර තිබුණු රෝගීන් 139 දෙනෙකු හෘද සැත්කම්වලට භාජනය කර තිබුණු නමුත්, ඒ සඳහා අයවිය යුතුව ඇති රු.79,996,348 ක් වූ රෝහල් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හෝ රෝගියා සමඟ නිසි එකඟතාවයකට පැමිණ නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන බව, හෘද සැත්කම් සඳහා යොමු කරන රෝගීන්ට සිදුකරන සැත්කම් වෙනුවෙන් අයකරගත යුතු මුදල් ප්‍රතිපූර්ණය කරගන්නා ආකාරය පිළිබඳව නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බව, 2017 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී එකඟ වූ පරිදි අවබෝධතා ගිවිසුමක් (MOU) කෙටුම්පත් කොට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති අංශය වෙත යොමු කළ බව. | රෝහල් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හෝ රෝගියා සමඟ නිසි එකඟතාවයකට පැමිණීමට හා ඒ පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාණ්ඩ මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම් හා ලංසු ලියවිලිවල සඳහන් කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරුවන් 36 දෙනෙකුගෙන් එකතුව රු.11,430,048 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ගිවිසුම් හා ලංසු ලියවිලිවල ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි ඇතුළත් කිරීමේ මූලික අරමුණ වූයේ සැපයුම්කරුවන් ඉක්මනින් භාණ්ඩ සැපයීම සඳහා පෙළඹවීමක් ඇති කිරීමට බව,<br>බොහෝ සැපයුම්කරුවන් යම් ප්‍රමාදයක් ඇතිවූ විට ඒ සඳහා බලපාන ලද හේතු දක්වමින් රෝහල වෙත යොමු කර කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කරන බව, එහිදී රෝහල් පරිපාලනය එම කරුණු වල සාධාරණත්වය සලකා සහන කාලයන් ලබා දී ඇති බව. | දෙපාර්ශවය විසින් අත්සන් තබන ලද ගිවිසුම හා ලංසු ලියවිලිවල සඳහන් කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. ප්‍රමාද ගාස්තු සඳහා සහන ලබාදෙන ලෙස ඉල්ලීම් සිදුකර ඇති විටෙක සැපයුම්කරුට නොවැලැක්විය හැකි කරුණු පමණක් සලකා බලා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් මත පමණක් සහන සලසාදීම කළ යුතුය.<br>නිරීක්ෂණයේ සඳහන් ප්‍රමාද ගාස්තුව අයකර නොගැනීමට හේතු ඉදිරිපත් කර නොමැති බැවින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමේ වගකීම පැහැර හැරි නිලධාරීන්ගෙන් ඊට හේතු විමසා විගණනයට වාර්තා කළ යුතුය. නොඑසේ නම් ඔවුන්ගෙන් අයිභාර කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදී රු.23,544,099 කට මිලදී ගෙන තිබුණු සායනික අපද්‍රව්‍ය දහන යන්ත්‍රය (Incinerator) රෝහල් කාර්ය මණ්ඩලයට අපහසුතා ඇතිවන ස්ථානයක සවිකර තිබුණි. නිසි ගිවිසුමකට එළඹීමකින් තොරව බාහිර ආයතනයක් වෙත කුලියට ලබා දී තිබුණු යන්ත්‍රයේ උපරිම ධාරිතාවය ඉක්මවා සායනික අපද්‍රව්‍ය දහනය කරමින් පවතින නමුත් ඒ සම්බන්ධ අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | දිනකට දහනය කළ යුතු සායනික අපද්‍රව්‍ය ප්‍රමාණය, යන්ත්‍රය ක්‍රියා විරහිතව තිබිය යුතු කාලය යනාදී කරුණු සම්බන්ධයෙන් කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොමැති බව, ඒ හේතුවෙන් සායනික අපද්‍රව්‍ය දහන යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව විධිමත් අධීක්ෂණයක් සිදු කිරීමට නොහැකි වී ඇති බව හා ඉදිරියේදී මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව. | යන්ත්‍රයේ උපරිම ධාරිතාවය ඉක්මවා සායනික අපද්‍රව්‍ය දහනය නොකරන බවටත්, යන්ත්‍රය නිසියාකාරයෙන් නඩත්තු කරන බවටත් අදාළ කොන්දේසි ඇතුළත් කරමින් ගිවිසුම සංශෝධනය කර විධිමත් අධීක්ෂණයක් සිදු කළ යුතුය. දහන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමෙන් රෝහල් කාර්ය මණ්ඩලයට සිදුවන අපහසුතා මඟහැර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලින් බැහැරව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය තහවුරු නොවන ලෙස තෝරාගත් සැපයුම්කරුවෙකු වෙත 2017 අගෝස්තු 01 දිනෙන් ආරම්භ වූ මාස 15 ක කාලයක් සඳහා මාසයකට රු.3,652,600 ක් බැගින්ද, 2018 නොවැම්බර් 01 දිනෙන් ආරම්භ වූ වර්ෂයක කාලයක් සඳහා මාසයකට රු.5,524,830 ක් බැගින්ද ගෙවීමේ කොන්දේසියට යටත්ව රෝහල පිරිසිදු කිරීමේ සේවාව ප්‍රදානයකර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව, පිරිසිදු කිරීම් සිදුනොකිරීම හා නියමිත සේවක සංඛ්‍යාව සේවයේ නොයෙදීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් අයකළ යුතු දඩ මුදල රු.2,352,750 ක් ලෙස අදාළ නිලධාරීන් විසින් ගණනයකර තිබුණද කිසිදු සාධාරණ හේතු දැක්වීමකින් තොරව රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් එම දඩ මුදල රු.1,175,335 කින් අඩුකර අයකිරීම සඳහා නියෝග ලබාදී තිබුණි. | පිරිසිදු කිරීම් සිදු නොකිරීම හා නියමිත සේවක සංඛ්‍යාව නොයෙදවීම හේතුකොට ගෙන කොන්ත්‍රාත්කරුවන්ගෙන් දඩ අය කිරීමට ඉදිරියේදී විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී ඒ අනුව දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය තහවුරු නොවන ලෙස කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම හා දඩ මුදල රු.1,175,335 කින් අඩුකර අයකිරීමට නියෝග ලබාදීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවන ලෙස අභ්‍යන්තර පාලන පද්ධතිය හා ක්‍රමවේදයන් ස්ථාපිත කර පවත්වා ගෙන යායුතුය. නියමිත සේවක සංඛ්‍යාව සේවයේ නොයෙදීම හේතුවෙන් රෝහල පිරිසිදු කිරීමේ කාර්යය නිසියාකාරව සිදු නොවන බැවින් දඩ අයකිරීමට වඩා සේවකයින් නිසි පරිදි සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලින් බැහැරව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය තහවුරු නොවන ලෙස තෝරාගෙන තිබුණු සැපයුම්කරුවෙකු වෙතින්, වෙළඳපල මිල සැඳැහුම් ක්‍රමයට භාණ්ඩ මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් සතු රු.මිලියන 10 ක් වූ මූල්‍ය සීමාව ඉක්මවමින් 2018 මාර්තු 27 දින රු.16,642,700 කට Diagnostic, Surgery and | ටෙලෙස්කෝප් 6 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 03 ක් ලෙස ගණනය කර වෙළඳපල මිල සැඳැහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවූ බව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අමතර අයිතම මිලදී ගැනීමට යාමේදී මූල්‍යමය වටිනාකම ඉහළ ගිය බව, ලංසු ලියවිලි කෙටුම්පත් කිරීමේදී උපකරණයට අදාළ සියළුම උපාංග පිරිවිතරවලට ඇතුළත් කර ඇති නමුත් මිල ගණන් ඉදිරිපත් කළ යුතු ලේඛනය තුළ ප්‍රධාන අයිතම දෙකේ මිල පමණක් සඳහන් කිරීමට අවස්ථාව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය තහවුරු නොවන ලෙස කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. තාක්ෂණික පිරිවිතර පිළිබඳ සාමාන්‍ය කොන්දේසි ප්‍රකාරව, ලබාගත යුතු වර්ෂ 2 ක වගකීම් කාලය ලබා ගැනීමට හෝ ඒ පිළිබඳව නොසලකා මුදල් ගෙවූ |

| | | |
|---|---|---|
| Treatment Nose and Nasal Telescope $0^0$ & $30^0$ උපකරණ 05 ක් හා අමතර උපාංග මිලදීගෙන තිබුණි. අමතර උපාංග සඳහා ලංසු කැඳවා නොතිබුණු නමුත් රු.13,892,700 ක් වූ අමතර උපාංග මිලදීගෙන තිබුණි. තාක්ෂණික පිරිවිතර පිළිබඳ සාමාන්‍ය කොන්දේසි ප්‍රකාරව, ලබාගත යුතු වර්ෂ 2 ක වගකීම් කාලය වෙනුවට වර්ෂයක වගකීම් කාලයක් පමණක් ලබාගෙන තිබුණි.<br><br>තාක්ෂණික පිරිවිතරයන්හි අනිවාර්ය අංගයක් ලෙස දක්වා තිබුණු උපාංගයක් සඳහා මිල ගණන් ඉදිරිපත්කර නැති ලංසුකරු ඇගයීමෙන් ඉවත්කළ යුතු වුවද එසේ ඉවත් නොකර එම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානයකර තිබුණි. | ලබාදී ඇති බව, ඒ අනුව මිල ගණන් ඉදිරිපත්කළ ආයතන උපාංග සඳහා මිල ගණන් අමතර අයිතම ලෙස දක්වා ඉදිරිපත් කර ඇති බව, මෙය කෙටුම්පත් සකස් කිරීමේදී ඇති වූ දෝෂයකින් සිදු වූ බව, වර්ෂ 02 ක වගකීම් කාලයක් ඉල්ලා තිබුණද වර්ෂයක වගකීම් කාලයක් පමණක් ලබා දී තිබුණු බව හා තාක්ෂණික ඇගයීම් කමිටුව එය අනුමත කර තිබුණු බව. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර අදාළ කොන්ත්‍රාත්කරුගේ පසුගිය වර්ෂ 5 ක මූල්‍ය තත්ත්වය පරීක්ෂාවට භාජනය නොකර, වැඩහළක් හා කාර්යාලයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.87,019,408 කට 2016 නොවැම්බර් 09 දින ප්‍රදානයකර තිබුණි. ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිමකළ යුතු දිනය 2018 දෙසැම්බර් 31 දින වන විට මාස 08 කින් ඉකුත් වී තිබුණි. ඒ වන විට කළ වැඩ වටිනාකම කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 26 ක් පමණක් විය. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.16,675,082 ක් ගෙවා තිබුණු අතර 2018 අප්‍රේල් 17 දින වන විට ඉන් රු.5,219,979 ක් පමණක් අයකර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව රු.4,350,969 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. ඉදිකිරීම් නිම නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේදී | 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්තුව නිමකළ යුතු දිනය මාස 08 කින් ප්‍රමාද වුවද, මේ වන විට එහි නිම කිරීම් සියයට 75 ක් පමණ දක්වා වර්ධනය වී ඇති බව, කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව, අයකළ යුතු ප්‍රමාද ගාස්තුව රු.4,350,969 කින් රු.මිලියන 1 ක් අයකර ගත් බව, ඉතිරි මුදල් ඉදිරි ගෙවීම්වලදී කපා ගැනීමට කටයුතු කරනු ලබන බව,<br>වැඩපල හා පිරිමි හෙද නේවාසිකාගාර ගොඩනැගිලි ඉදිකරන තෙක් එම සේවා පවත්වාගෙන යාම සඳහා කන්ටේනර් 14 ක් කුලියට ලබාගෙන තිබෙන බව. | කොන්ත්‍රාත්කරු ලවා කොන්ත්‍රාත්තුව කඩිනමින් අවසන් කරවා ගැනීමට පියවර ගත යුතුය.<br>ඉතිරි ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර අදාළ කොන්ත්‍රාත්කරුගේ පසුගිය වර්ෂ 5 ක මූල්‍ය තත්ත්වය පරීක්ෂාවට භාජනය නොකර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට වගකිව යුතු නිලධාරීන්ගෙන් අතිරේක පිරිවැය අධිභාර කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.3,015,000 ක් වැයකර කුලියට ලබාගත් Containers 14 ක් තුළ අදාළ වැඩහළ හා කාර්යාලය පවත්වා ගෙන ගොස් තිබුණි. | | |
| (ආ) | හෙද නිලධාරීන්ට නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.59,808,300 කට 2017 පෙබරවාරි 16 දින ප්‍රදානයකර තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්තුව නිම කළ යුතු දිනය මාස 06 කින් ඉකුත් වී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට කළ වැඩ වටිනාකම කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 9 ක් පමණක් විය. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.11,257,340 ක් ගෙවා තිබුණු අතර 2019 මාර්තු 09 දින වන විට ඉන් රු.1,130,438 ක් පමණක් අයකර තිබුණි. ඉදිකිරීම් නිම නොකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් දක්වා වූ මාස 22 ක් සඳහා කුලී, ජල හා විදුලි බිල්පත් වෙනුවෙන් රු.1,218,397 ක් වැයකර හෙද නිලධාරීන් සඳහා කුලී නිවසක් ලබාගෙන තිබුණි. | 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්තුව නිමකළ යුතු දිනය මාස 06 කින් ප්‍රමාදවී ඇති බව, රෝහල් පරිපාලනය විසින් තදින් අවවාද කිරීමෙන් පසු නව උප කොන්ත්‍රාත්කරුවකු යටතේ සේවකයින් වැඩි සංඛ්‍යාවක් යොදවා වැඩ කරගෙන යමින් පවතින බව, ගොඩනැගිල්ල ඉදිකරන තෙක් පිරිමි හෙද නිලධාරීන් සඳහා ලබාගන්නා ලද නිවස්නය සඳහා කුලිය හා විදුලි බිල් ගෙවීමට සිදුවන බව. | කොන්ත්‍රාත්කරු ලවා කොන්ත්‍රාත්තුව කඩිනමින් අවසන් කරවා ගැනීමට පියවර ගත යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෝහලේ ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම් හා ශ්‍රේණිගත කිරීම් සම්බන්ධ විධිමත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙලකර අනුමත කරගැනීමට 2018 දෙසැම්බර් 31 වන විටත් කටයුතුකර නොතිබුණි. | 2012 වර්ෂයේදි ප්‍රතිව්‍යුහගත යෝජනා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර ඇති බව හා නැවත සංශෝධිත යෝජනා සමඟ ඉදිරි මාස 02 තුළදි ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙලකර අනුමත කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මණ්ඩලයේ ලේකම් හා නීති නිලධාරී ලෙස තනතුරක් ඇතිකර කොන්ත්‍රාත් පදනම මත නිලධාරිණියක බඳවා ගෙන තිබුණු අතර නියමිත පරිදි පැමිණීම පිටවීම සිදුකළ බවට තහවුරු කළ හැකි | ඇයගේ දුර්වල පැමිණීම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම අවවාද කර ඇති බව, නමුත් ඒ සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාරයක් නොදැක්වූ හෙයින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා මෙම තනතුර සඳහා වෙනත් අයෙකු පත්කර | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු ඇති කිරීමට හා එවැනි තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු නොකළ යුතුය. |

| | |
|---|---|
| ලේඛනගත සාක්ෂි කිසිවක් පවත්වාගෙන ගොස් නොතිබුණු මාස 08 ක කාලය සඳහා දීමනා ලෙස රු.899,563 ක් ගෙවා තිබුණි. ඉන් අනතුරුව පැමිණීම හා පිටවීම පිළිබඳ සටහන් පවත්වා තිබුණු මාස 11 ක කාලය තුළ පැමිණිය යුතු දින 129 කින් දින 47 ක්ම සේවයට පැමිණ නොතිබුණු බව නොසලකා රු.1,247,657 ක් වූ සම්පූර්ණ දීමනාව ගෙවා තිබුණි. | ගැනීමට කටයුතු කළ බව. |